දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600 / 011-2136650 / 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169 / 011- 2876181
විද්‍යුත් තැපෑල / மின் - அஞ்சல் / E - mail: info @psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/PRO/HB/26/2023
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2023.08. 25

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

<u>රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීම් / උසස් කිරීම්වලට අදාළව සේවා ව්‍යවස්ථාවල සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතිකවල වලංගුභාවය තහවුරු කර ගැනීම</u>

සේවා ව්‍යවස්ථාවල සඳහන් පත් කිරීම් / උසස් කිරීම්වලදී සුදුසුකම් සනාථ කිරීම සඳහා නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතික, අදාළ තනතුරේ පරිපාලන බලධාරීත්වය දරනු ලබන අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් එම සහතික නිකුත් කරන ලද ආයතනයෙන්ම සනාථ කර ගැනීමෙන් අනතුරුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බවට එම කොමිෂන් සභාව තීරණය කර ඇති බව කාරුණිකව දන්වමි.

02. ඒ අනුව, එම පත් කිරීම් / උසස් කිරීම් වලට අදාළව නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී එම කොමිෂන් සභාවේ නියමය පරිදි පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව වැඩිදුරටත් දන්වා සිටිමි.

I. පත් කිරීම්වලට / උසස් කිරීම්වලට අදාළව යොමු කරනු ලබන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතික පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම එම සහතික පත් නිකුත් කරන ලද ආයතනයෙන් සනාථ කර ගැනීමෙන් අනතුරුව, අදාළ පත් කිරීම් / උසස් කිරීම් කටයුතු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

II. නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන එකී සහතික පත්‍රවල වලංගු බව තහවුරු කර ගැනීමට ගතවන ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා විශේෂයෙන්ම උසස් කිරීම් කටයුතුවලදී අදාළ උසස්වීම් බලාත්මක වන දිනට යටත් පිරිසෙයින් මාස 03කට හෝ ප්‍රථම මෙකී සහතික පත්‍ර සනාථ කිරීමේ කටයුතු ආරම්භ කිරීම.

III. තවද මෙකී කර්තව්‍ය වඩාත් කඩිනමින් සිදු කිරීම සඳහා මෙම සනාථ කිරීමේ ක්‍රියාවලියේ දී හැකිතාක් විද්‍යුත් තැපැල භාවිතය මගින් අදාළ ආයතන හා සම්බන්ධ වීමට කටයුතු කිරීම.

03. ඒ අනුව ඉදිරියේ දී ඉහත පරිදි කටයුතු කරන්නේ නම් මැනවි.

Mdayar

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව